

# අභා ගඟුල

කලාප අංක : 91

ශ්‍රී බු. ව. 2558 ක්වූ මැදින් මස කලාපය, රාජ්‍ය වර්ෂ 2015 ක් වූ අප්‍රේල් මස 03 වන දින

මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති
ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

## අපණ්ණක ප්‍රතිපදව හඳුනාගෙන දෙලොව ජය ගනිමු.

(ජාතක පාලියේ අපණ්ණක ජාතකය ඇසුරිනි)

ගරු ස්වාමීන් වහන්ස, පින්වත්නි,

**අපණ්ණකං ඨානමෙකෙ - දුතියං ආහු තක්කිකා**
**එත දඤ්ඤාය මෙධාවී තං ගණ්හෙ යද පණ්ණකන්ති .**

**"ඇතැම් තාර්කිකයෝ අපණ්ණක ස්ථානය දෙවැනි තැන තබතියි කියූහ. නුවණැත්තෝ මේ කරුණ දැන යමක් අපණ්ණකද එය ගන්නේය."**

අද බක් පුර පසළොස්වක පොහොය දිනයයි. බුදුරජානන්වහන්සේ දෙවනවර් ලක්දිව නාගදීපයට වැඩමවීම, කැලණියට වැඩමවන මෙන් මණිඅක්ඛිත රජතුමා බුදුන්වහන්සේට ආරාධනා කිරීම මිණි පළඟ තැන්පත් කොට නාගදීප සෑය බැඳවීම යන කරුණු සිදුවුයේ මෙම බක්පුර පසළොස්වක පොහොය දිනයේය. ගස්වල පැරණි කොළ ඉවත්වී අලුත් දළු ද වල අපේක්ෂාවෙන් සිටින්නේ මෙම භාග්‍යවන්ත මාසයේය. ඒ නිසා ගිහි පැවිදි අප සියලුම දෙනා අපණ්ණක ප්‍රතිපදව හඳුනාගෙන භාග්‍යවන්ත පිරිසක් වී දෙලොව ජයගැනීමට උත්සාහවත් විය යුතුයි.

පාලි භාෂාවෙන් "පණ්ණ" යනු කොළවලට නමකි. අපණ්ණ යනු කොල නැතියන අර්ථය ගෙනදෙන වචනයකි. බුදුන්වහන්සේ දේශණා කළ ධර්ම මාර්ගය කොළ නැති පාරකි. එයින් අදහස් වන්නේ කෙලෙස් නැමති කොළ නැති බවයි. මෙම අපණ්ණක ප්‍රතිපදව ගැන දැන ගත හැකි මූලාශ්‍ර කීපයක් පෙළ දහමේ සඳහන් වේ. අප මෙහි ඉහතින් දැක්වූ ජාතක පාලියේ එන අපණ්ණක ජාතකය ඉන් එකකි. අංගුත්තර නිකායේ සඳහන් අපණ්ණක පටිපදසූත්‍රය, අපණ්ණක පටිපද(පධාන) සූත්‍රය, අපණ්ණක පටිපද (දිට්ඨි) සූත්‍රය යන මේවා අනෙක් මූලාශ්‍රයෝය.

අපණ්ණක ප්‍රතිපදව පිළිබඳ සරළ අර්ථයක් ලබාගත හැකි අපණ්ණක ජාතකය මෙහිදී විමසාබැලිය යුතුයි. බුදුන්වහන්සේ ජේතවනාරාමයෙහි වැඩවාසය කරන කල්හි පන්සියක් තීර්ථක ශ්‍රාවකයින් අරභයා මේ ජාතක දේශනාව සිදුකරන ලදී. අනේපිඩු මහසිටුතුමාගේ උපදෙස් පරිදි මේ පන්සියක් තීර්ථකයින් බුදුන්වහන්සේගේ ධර්මය අසා පැහැදී ක්‍රියා කළහ. නමුත් බුදුන්වහන්සේ ජේතවනාරාමයෙන් බැහැරට වැඩමවූ පසු නැවතත් තීර්ථකයින් සමග එකතු විය. නැවත බුදුන්වහන්සේ ජේතවනාරාමයට වැඩමවූ පසු

මේ බව දැනගෙන උපාසකවරුනි, තෙරුවන් සරණ හැර වෙන සරණක් ප්‍රාර්ථනා කළේදැයි විමසීය. සැගවිය නොහැකි නිසා එසේය ස්වාමීනි යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට බුදුන්වහන්සේ දේශනා කළේ යටින් අවීචි නිරයත් උඩින් භවාග්‍රයත් සරසින් අප්‍රමාණ ලෝක ධාතූන්හිත් ශීලාදි ගුණයෙන් යුතු අය අතර බුදුන්වහන්සේ තරම් ශ්‍රේෂ්ඨ උත්තමයෙකු නැති බවයි. ඒ නිසා ඒ උත්තමයා පිළිබඳ විශ්වාසය ඇතිකර ගෙන අපණ්ණක නම් ප්‍රතිපදාව හඳුනාගෙන ජීවත්වන්නා යැයි අවවාද කළහ.

අපණ්ණක ප්‍රතිපදාව හඳුනානොගෙන ක්‍රියා කරන අය සමාජයේ සතුරු බලවේගවලට හසුවන බව මෙම ජාතක දේශනාව සඳහන් කරයි. කසිරට බරණැස් නුවර අප මහ බෝසතානන්වහන්සේ වෙළඳකුලයක ඉපිද ගැල් පන්සියක වෙළඳාම් කරමින් ජීවත්වේ. ඒ නුවරම වෙළඳාමේ අදක්‍ෂ තවත් වෙළඳ පුත්‍රයෙක් සිටී. බෝසතාණන්වහන්සේ වෙළඳාම සඳහා පිටත්වන්නට සූදානම් වූ විට අනෙක් වෙළෙන්දාද වෙළෙඳාම සඳහා පිටත් වන්නට සූදානම් විය. එහිදී බෝසත් වෙළෙන්ද 'අනෙක් වෙළෙන්දාගෙන් ඇසුවේ කවුරු පළමුවෙන් වෙළඳාම සඳහා යා යුතුද කියායි. අදක්‍ෂ වෙළඳ නායකයා කීවේ තමා මුලින් යා යුතු බවයි. මුලින්ම යන අයට අබලන් නොවූ මාර්ගවලින් යා හැකිය. ගොනුන්ට නොඉඳුල් තණකොළ ලැබෙන්නේය. මිනිසුන්ට නොඉඳුල් පලා කොළ ලැබෙන්නේය. නොකැළඹුණු ජලය ලැබෙන්නේය. කැමති පරිදි වෙළඳ බඩුවලට මුදල් නියම කළ හැකි වන්නේය. මෙසේ මුලින්ම වෙළඳාමේ යාමේ ආනිසංස දුටු ඔහු පිටත් විය. ඔවුන් කාන්තාරයක් සමීපයට එනවිට එම කාන්තාරයට අධිගෘහිත යක්‍ෂයෙක් වෙස්වලාගෙන අවුත් ඔවුන්ට මෙසේ කියයි. තව සුළු දුරක් ගිය තැන ක්ෂේම භූමියකි. නිතර වැසි වසින ජලයෙන් පිරී ඇලදොළ ආදියෙන් යුක්තය. එම නිසා ගැල්වල වතුර පුරවාගෙන යාමෙන් ප්‍රයෝජනයක් නැතැයි කියා ජලය ඉවත් කළහ. යක්‍ෂයාගේ රැවටුම් බස්වලට රැවටුන අදක්‍ෂ වෙළඳ නායකයා කාන්තාරයේ කොටුවී ජලය නැතිව මැරී ගියහ. මේ අදක්‍ෂ වෙළඳ නායකයා අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගෙන තිබුනේ නැත. මෙහි අපණ්ණක ප්‍රතිපදාව යනු තමාගේ වෙළඳාමේදී ඊට විරුද්ධ බලවේග හඳුනා ගැනීමයි.

බෝධිසත්ව වෙළඳ නායකයා අදක්‍ෂ වෙළෙන්ද පිටත් වී මාස එකහමාරකට පසුව ගමනට පිටත් විය. එහිදී බෝසතාණන් වහන්සේ සිය පිරිවරට මතක් කළේ මාගෙන් නොවිමසා පතක් පමණවත් දිය පරිභෝජනය නොකළ යුතුයි.කාන්තාරයේ විෂ ගස් ඇත. මින් පෙර ඔබලා නොකෑ කොළ මල්,ගෙඩි ආදිය කිසිවක් මගෙන් නොවිමසා පරිභෝජනය . නොකළ යුතුයි. මෙසේ පිරිවර ජනයාට පිළිවදන් දී කාන්තාරයට පිවිසියේය.

බෝසතාණන් වහන්සේ සහිත වෙළඳ පිරිස කාන්තාරයට පිවිසි කල්හි පෙර පරිදිම යක්‍ෂයා එතනට පැමිණියේය. බෝසත්හු දුටුවනම යක්‍ෂයෙකුබව තේරුම් ගත්හ. මේ කාන්තාරයේ ජලය නැත. මොහුගේ ස්වරූපය බිය සහිතය. රතු නෙත් ඇත්තේය. මොහුගේ සෙවනැල්ලද නොපෙනේ. නිසැකවම මේ යක්‍ෂයා විසින් පෙරටුව ගිය නුවන මඳ වෙළඳ පුත්‍රයා රවටා සියලු ජලය ඉවත් කරවා ක්ලාන්තකොට පිරිවර සහිතවම විනාශ කරන ලදහ. මම මොහුට නොරැවටෙමි. වෙනත් දියක් දකින තුරු මෙම ගැල්වල තිබෙන දිය පොදක්වත් අපතේ නොදමි. දිය දුටු තැනකදී ගැල්වල දිය අස්කොට ගැල් සැහැල්ලු කර ගනිමි. වෙළඳාම පිළිබඳව දක්‍ෂව ක්‍රියා කළ බෝසතාණන්වහන්සේ මේ අනුගමනය කළේ වෙළඳාම පිළිබඳ අපණ්ණක ප්‍රතිපදාවයි. තමා හඳුනාගත් බව දැනගත් යක්‍ෂයා මේ නැණවත් වෙළඳ පිරිසට කරදර නොකොට යක්‍ෂ පුරයමට ගියහ. පන්සිය පනස් ජාතක පොතේ එන මුල්ම ජාතක කථාව අපණ්ණක ජාතකයයි. එම ජාතක කථාවට අනුව දියුණුවේ දක්‍ෂ හැම දෙනාම තමාගේ දියුණුවට විරුද්ධ බලවේග ලෙස ක්‍රියා කරන යකුන් හා යක්‍ෂණියන් හඳුනාගෙන ක්‍රියා කළ යුතුයි.

මේ බක් පුර පසළොස්වක පෝය දින සිල් සමාදන් වී සිටින කුඩා දරුවෙනි, තරුණ තරුණියනි, වැඩිහිටියනි, ගරු හිමිවරුනි අපි සියලුම දෙනාත් මෙම අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගෙන ජීවත් වෙමු. එසේ ක්‍රියා කළහොත් අපට දෙලොව ජයගත හැකිය. නැතිනම් අපි විවිධ යකුන් හා යක්ෂණියන්ගේ ගොදුරු බවට පත්වී විනාශ වෙමු.

අංගුත්තර නිකායේ තික නිපාතයේ තෙවැදෑරුම් අපණ්ණක ප්‍රතිපදාවක් ගැන සඳහන් වේ. කරුණු තුනකින් යුක්ත භික්ෂුව අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගෙන ක්‍රියා කොට කෙලෙස් නැති කොට නිවනට පිවිසෙන බව දක්වා ඇත. එම සූත්‍රයට අනුව ඒ කරුණු තුන මෙසේ සඳහන් කරමි.

"ඉධ භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති. භොජ්නෙ මත්තඤ්ඤූ හොති. ජාගරියං අනුයුත්තො හොති". මේ ශාසනයෙහි අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගත් භික්ෂුව ඉඳුරන්ගේ දොරවල් වසා තබයි. භෝජනයෙහි පමණ දැනගෙන ක්‍රියා කරයි. නිදිවැරීම නම්වූ ජාගරියානුයෝගීව ජීවත්වේ. මේ කරුණු තුනට අනුව ජීවිතය පවත්වාගෙන යනු ලබන භික්ෂුවට යකුන්ගෙන් හා යක්ෂණියන්ගෙන් කිසිදු කරදරයක් නොවේ.

මෙහි මුලටම එන්නේ ඉන්ද්‍රිය සංවර සීලයයි. අපි අපේ ඉඳුරන්ගෙන් බාහිර අරමුණු ගෙන ක්‍රියා කරමු. එහිදී මනා සිහියෙන් යුක්තව ක්‍රියා කළ යුතුයි. ඇසින් රූපයක් දුටුවිට එය බැලිය යුතුද නැද්ද කියා සිතා බලා නොබැලිය යුතු එකක් නම් ප්‍රතික්ෂේප කළ යුතුයි. එසේ නුසුදුසු රූප බැලීමේදී සිදුවන්නේ අසංවරවූ ඇස තුළින් මනසට ආශ්‍රව නම්වූ කෙලෙස් ගලා ඒමයි. එම කෙලෙස් අපේ දෙලොවම අඳුරට පත් කරවයි.

අපණ්ණක ප්‍රතිපදාවේ දෙවන කරුණ ලෙස දක්වා ඇත්තේ භෝජනයෙහි පමණ දැනගෙන ක්‍රියා කළ යුතු බවයි. ගිහි පැවිදි අප හැමදෙනාටම ආහාර අවශ්‍යය. එහිදී එම ආහාර ගත යුත්තේ කුමක් සඳහාද, කොපමණ ආහාර ගත යුතුද? ගත යුත්තේ කුමන ආහාරද යන්න සිහියේ තබා ගෙන ක්‍රියා කළ යුතුය. භික්ෂුවගේ ආහාර පරිභෝජනය ගැන කරුණු දක්වන විට දක්වා ඇත්තේ මම මේ ආහාර වළඳන්නේ ජවය, මදය, ශරීර අලංකාරය ඇතිකර ගැනීම පිණිස නොවේ. මාගේ ජීවිතය පවත්වාගෙන යාම සඳහාත් ශාසනික බ්‍රහ්ම චරියාව පවත්වාගෙන යාම සඳහාත්ය. කාමභෝගී ජීවිතගත කරන ඔබට පැවිද්දට තරම් සරළ ආහාර ප්‍රතිපත්තියක් පවත්වාගෙන යා නොහැකි වුවත් හැකි තරම් මේ ක්‍රමය අනුගමනය කිරීමට උත්සාහවත් විය යුතුයි.

අපණ්ණක ප්‍රතිපදාවේ තුන්වන කාරණය ජාගරියානු යෝගයයි. බුදුදහම උගන්වන පසළොස් චරණ ධර්මවලද මෙම ජාගරියානුයෝගය සඳහන්වේ. මින් අදහස් කරන්නේ නොනිදා සිටීමයි. මිනිසාට නින්ද අවශ්‍යය. නමුත් එහි ප්‍රමාණයක් තිබිය යුතුය. බෞද්ධයා හැටියට අප නොනිදා සිටින්නේ කුමක් සඳහාද? සිතේ ඇතිවන ක්ලේශ ධර්මයන් හෙවත් කෙලෙස් කොළ ඉවත් කර ගැනීමටයි(අපණ්ණක) මේ සඳහන් කළ අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගෙන ක්‍රියා කරන ගිහි පැවිදි කිසිවෙකුට යකුන්ගෙන් හා යක්ෂණියන්ගෙන් කිසිදු කරදරයක් නොවනු ඇත.

මේ දහම් පත්‍රිකාව කියවන අපේ පොඩි හාමුදුරුවරුනි, ගිහි ගෙදර ජීවත් වන පින්වත් දරුවෙනි. ඔබ මේ අපණ්ණක ප්‍රතිපදාව හඳුනාගෙන ජීවත් උනොත් ඔබේ ජීවිතය දෙලොවින්ම ජය ගත හැකිය. ඉගෙනුම ලබන පොඩි හාමුදුරුවරුනි, ඔබ දෙමාපියන්ගෙන් ඈත්වී විහාරස්ථානයක ජීවත්වන විට තම ගුරු දේව නායක මාහිමියන්ට කීකරුව තමාගේ ඉගෙනීමේ කටයුතු කරගත යුතුයි. තමාට සිව්පසයෙන් උපස්ථාන කරන ගිහි දායකයින්ගේ ආගමික අවශ්‍යතාවයන් ඉටුකර ගෙන, ගුරුවරයාගේ සිත් නොරිදෙන ලෙස ක්‍රියා කළ යුතුයි.

නූතනයේ භික්ෂූන්වහන්සේලාට එන අභියෝග ජයගත හැක්කේ උගත්කම ඇති භික්ෂූන් වහන්සේලාට පමණි. නුගත් භික්ෂූන්වහන්සේලා බණ දන්නා ගිහිපින්වතුන් ඉදිරියේ සැහැල්ලුවට පත්වනු ඇත. ඒ නිසා බුදුදහම පිළිබඳ හොඳින් ඉගෙන විවිධ භාෂාඥානය ඇතිකරගෙන ක්‍රියා කළොත් තම ගුරුවරයාගේ මෙන්ම ගිහි ජනතාවගේද සිත් සතුටු කළ හැක. එහිදී තමාගේ ඉගෙනීමට බාධකවන ජංගම දුරකථන ඇතුළු නවීන උපකරණ ගැන සැලිකිලිමත් විය යුතුයි. පොඩි හාමුදුරුවනේ මේ අපට තිබෙන අපණ්ණක ප්‍රතිපදාවයි.

ගිහිගෙදර ජීවත් වන පින්වත් දරුවනි, ඔබට ඔබේ ගෙදර ජීවත්වන වටිනාම දෙපොල ඔබේ මව සහ පියායි. ඒ දෙදෙනාගේ සිත අසතුටුවන ලෙස කටයුතු කරන්න එපා. අපේ බොහෝ දෙමාපියවරු කියන්නේ අනේ හාමුදුරුවනේ අපේ පුතා අප සමග සතුටින් කථා කරන්නේ නැත. අපේ දුව අප සමග සතුටින් කථා කරන්නේ නැත. ඔවුන් ගෙදර ආ විගසම මුහුණ නරක් කරගෙන කාමරයට ගොස් දොර වසා ගනී. ජංගම දුරකථනය, ෆේස්බුක්, වැනි පහසුකම්වලට හසුවී ක්‍රියා කරයි. අප උයා දෙන කෑමටික කන්නේ නැත. ඒ දරුවන් නොකා සිටින විට අපි කන්නේ කොහොමද? ඒ නිසා අපිත් නොකා නිදා ගනිමු. දරුවනේ මේ තත්වය ඉතාම අවාසනාවන්තයි. මේ පණ්ණක ප්‍රතිපදාවයි. එහි කෙළවර අපිට මුහුණ දෙන්නට සිදුවන්නේ පිළිකා වැනි භයානක රෝගයකින් අපේ දෙමාපියන් පරලොව යෑමයි. ලේ අපිරිසිදුවීම තුළින් පිළිකා සෑදෙන බව බොහෝදෙනාගේ මතය වී තිබේ. ඒ නිසා අපේ ගෙදර ජීවත්වන අපේ ආදරණීය දෙමාපියන්ගේ සිත සතුටුවන සේ කටයුතු කරමින් ඒ දෙපලට අවුරුදු 120 ජීවත් වන්නට ඉඩ සළසා දෙමු. දරුවනේ මේ අපණ්ණක ප්‍රතිපදාවයි.

ගිහිගෙදර ජීවත්වන දෙමාපියන් ඇතුළු වැඩිහිටියනි , අපි සියලුම දෙනා බෞද්ධයෝ වෙමු. එසේනම් අපට සිටින ඉතාම උතුම් කල්‍යාණ මිත්‍රයා අපේ බුදුරජාණන්වහන්සේය. එම කල්‍යාණ මිත්‍රයා දේශනා කළ අපණ්ණක ප්‍රතිදාව හඳුනාගෙන ක්‍රියා කරමු. අද බොහෝ අය මිලමුදලට ඇති ආශාව නිසා බුදුන්වහන්සේ අමතක කර වෙනත් දේව ඇදහිලි- දේව කන්නලව් වලට ඇබ්බැහිවී තිබේ. වෙන කිසිදක නොවූ තරම් මිත්‍යාමතවල එල්බී සිටින දෙමාපිය වැඩිහිටියන් අද දැකිය හැක. මේ තත්වය මෙසේ ඉදිරියට ගියහොත් මිත්‍යාමත නැමති කොළවලින් අපේ ඉදිරි ගමන නැමති පාර වැසියනු ඇත. ඒ නිසා බෞද්ධයාගේ අනන්‍යතාවය හඳුනාගෙන ක්‍රියා කළ යුතුයි. අප හිස පහත්කර වඳින්නේ අපේ බුදුරජාණන් වහන්සේට පමණි. අප අනුගමනය කරන්නේ බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය පමණි. එසේ ක්‍රියා කළහොත් කාන්තාරයේදී යක්ෂයාගෙන් මිදී තම ජීවිතය සරුකරගත් බෝසතාණන් වහන්සේට මෙන්ම ගිහි පැවිදි අප කාටත් අපේ දෙලොව ජයගත හැක.

තෙරුවන් සරණයි... !